සියලු ම හිමිකම් ඇවිරිණි] All Rights Reserved]

විභාග අංකය - .....

පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව, නැගෙනහිර පළාත
Provincial Department of Education, Eastern Province

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) පෙරහුරු ඇගයීම - 2026 (ජුනි-ජූලි)
General Certificate of Education (Adv.Level) Practice Assessment – 2026 (June-July)

නර්තනය - (දේශීය) I
Dancing - (Indigenous) I

52 S I

ශ්‍රේණිය - 13
Grade - 13

පැය දෙකයි
Two hours

අමතර කියවීමේ කාලය; - මිනිත්තු 10;
Additional Reading Time - 10 minutes

අමතර කියවීමේ කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත්, පිළිතුරු ලිවීමේදී ප්‍රමුඛත්වය දෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදා ගන්න.

උපදෙස්

- **සියලුම** ප්‍රශ්නවලට සියල්ලට ම පිළිතුරු මෙම පත්‍රයේම සැපයිය යුතු ය.
- එක් ප්‍රශ්නයකට ලකුණු 2 බැගින් මුළු ලකුණු 100 කි.

- **අංක 1 සිට 25 තෙක් ප්‍රශ්න වලට පිළිතුරු සැපයීමේදී නිවැරදි හෝ වඩාත් ගැලපෙන හෝ පිළිතුර තෝරා, ඊට අදාළ අංකය ප්‍රශ්නය ඉදිරියේ ඇති වරහන තුළ ලියන්න.**

1. සබරගමු සම්ප්‍රදායේ 'භාතායක්කම' පෙළපාළිය අංගයේ ආශිර්වාද කවි ගායනයේදී භාවිතා කරන වාද්‍ය භාණ්ඩයකි.
   (1) පන්තේරුව (2) තාලම්පොට
   (3) උඩැක්කිය (4) හොරණෑව
   (5) පොකුරු බෙරය (.....)
2. දෙවන පරාක්‍රමබාහු රජුගේ මාළිගයට යාබද නාට්‍ය ශාලාවක් පැවැති බවට සඳහන් ග්‍රන්ථය වන්නේ,
   (1) ථූප වංශය (2) කව්සිළුමණ
   (3) සද්ධර්මරත්නාවලිය (4) කඳවුරු සිරිත
   (5) දඹදෙණි අස්න (.....)
3. වී පෙළීම හා ගොයම් කැපීම නිරූපණය කෙරෙන ද්‍රවිඩ ගැමි නැටුම් දෙකකි.
   (1) කෝලාට්ටම් සහ අරව් වෙට්ටු (2) සුලකු සහ වෙම්බු
   (3) වෙම්බු සහ අරව් වෙට්ටු (4) සුලකු සහ අරව් වෙට්ටු
   (5) කුම්මි සහ සුලකු (.....)
4. කුලීනයන් අතර පැවැති බටහිර බැලේ රංග කලාව පොදු ජනයා අතර ව්‍යාප්ත කිරීමට මුල් වූයේ,
   (1) ඇනා පව්ලෝවා ය. (2) 14 වන ලුවි රජු ය.
   (3) ජින් බැප්ටිස් ලලී ය. (4) කැතරින් ඩී. මෙඩිසි ය.
   (5) ජින් ජෝර්ජ් නොර්වේ ය. (.....)
5. බැරිසිල් මුද්‍රා නාට්‍යයේ කාන්තා චරිත නිරූපණය කිරීම සඳහා කෝලම් නාට්‍ය ඇසුරෙන් යොදා ගන්නා ලද බෙර පදය වන්නේ,
   (1) දිත්තම් දිතකු දොම් දොම් තාම් ය.
   (2) දොංත ගතං දොංත ගතිගතං ය.
   (3) ගුං දැහිං ගුද ගුද දැහිං ය.
   (4) දොම් තරිකිට දොම් දොම් තරිකිට ය.
   (5) ගත ගුම් රිම්ගත ගතිගත ගදින ගතම් ය. (.....)

6. සුභූති බලිය සහ කඨිනා බලිය යන බලි යොදාගනු ලබන්නේ,
(1) ගැබිණි මව්වරුන් සඳහා ය. (2) වර්ෂාව ලබාගැනීම සඳහා ය.
(3) නවග්‍රහ අපල දුරුකර ගැනීමට ය. (4) උපසම්පදා පින්කම් අවසානයේදී ය.
(5) කඨින උත්සව අවසානයේදී ය. (.....)

7. භරතමුණිගේ නාට්‍ය ශාස්ත්‍රයට අනුව රති සහ ජුගුප්සා බව භාව මගින් ඇති කරවන රස මොනවාද?
(1) වීර සහ රෞද්‍ර (2) ශෘංගාර සහ කරුණා
(3) ශෘංගාර සහ අද්භූත (4) කරුණා සහ බීභත්සා
(5) ශෘංගාර සහ බීභත්සා (.....)

8. වලියක් මංගල්‍යයේදී බැනිමතුන් විසින් පඬුරු ගැටගසනු ලබන්නේ,
(1) ගවරමලේ ය. (2) සිවිලි වළංවල ය.
(3) ඒකා වැලේ ය. (4) උල් උඩ ය.
(5) අටමගලේ ය. (.....)

9. ජිමික්කි, අට්ටියල්, කාසිමාලෙයි සහ පදක්කම් මාලේ පළඳිනු ලබන්නේ,
(1) කතක් නර්තනයේදී ය. (2) මණිපුරි නර්තනයේදී ය.
(3) ඔඩිසි නර්තනයේදී ය. (4) භරත නර්තනයේදී ය.
(5) කතකලී නර්තනයේදී ය. (.....)

10. ''නටන ගහපතියා විසින් පවරා දෙන ලදී.'' යනුවෙන් නර්තනය පිළිබඳ ඓතිහාසික තොරතුරු දැක්වෙන්නේ,
(1) සැස්සේරුව සෙල්ලිපියෙහි ය. (2) මැදගම සෙල්ලිපියෙහි ය.
(3) කොරවක්ගල සෙල්ලිපියෙහි ය. (4) අනුරූ සෙල්ලිපියෙහි ය.
(5) පාලමොට්ටායි සෙල්ලිපියෙහි ය. (.....)

11. පහතරට නර්තන සම්ප්‍රදායේ මාතර ශෛලියේදී පිල්ලූ වීදිය ඉදි කරනු ලබන ශාන්ති කර්මය වන්නේ,
(1) දෙවොල් මඩුව ය. (2) සන්නි යකුම ය.
(3) කිරි මඩුව ය. (4) රට යකුම ය.
(5) ගම් මඩුව ය. (.....)

12. මූලික බෙර සරඹ නිවැරදිව ප්‍රගුණ කිරීමෙන්,
(1) සම්ප්‍රදාය හඳුනාගනියි.
(2) වැරදි අක්ෂර වාදනය කිරීමේ හැකියාව ලබයි.
(3) ගායනය සමඟ වාදන හැකියාව ලබයි.
(4) බෙරයේ ව්‍යුහය හඳුනා ගනී.
(5) නර්තනය සඳහා වාදන හැකිය හැකියාව ලබයි. (.....)

13. උඩරට, පහතරට හා සබරගමු සම්ප්‍රදායන්ට අයත් ශාන්ති කර්ම නාට්‍යමය පෙළපාලි පිළිවෙළින් දැක්වෙන වරණය තෝරන්න.
(1) ඌරා යක්කම, නානු මුරය, පොත් කඩේ යක්කම
(2) නයා යක්කම, අඹ විදමන සහ පොත් කඩේ යක්කම
(3) විජේරාජ කතාව, අඹ විදමන සහ පොත්කඩේ යක්කම
(4) ඌරා යක්කම, දෙවොල් ගොඩ බැසීම සහ මුව මල විදීම
(5) මහා යක්කම, බොරු යක්කම සහ ගබඩා කොල්ලය (.....)

14. රංග වින්‍යාසය හා සබැඳි මූලික සංකල්ප ලෙස සැලකෙන්නේ,
(1) චලනය, ශරීරය සහ අංග හාර වේ.
(2) ශරීරය, තාලය සහ හැඩතල වේ.
(3) ශරීරය, හැඩතල සහ නිර්මාණ වේ.
(4) අංග, උපාංග සහ ප්‍රත්‍යංග වේ.
(5) චලන, අවකාශය සහ සම්බන්ධතා වේ. (.....)

15. ශාන්ති කර්ම වලදී වෙස් මුහුණු වෙනුවට අංග රචනා ක්‍රමවේද භාවිතා කෙරෙන චරිත ලෙස සැලකෙන්නේ,
(1) ඊරි යකා සහ ලිච්ඡවී ය. (2) ඊරි යකා සහ වඩිග පටුන ය.
(3) වඩිග පටුන සහ කෝලම් සන්නිය යි. (4) ලිච්ඡවී සහ ගොලු සන්නිය යි.
(5) වඩිග පටුන සහ මරු සන්නිය යි. (.....)

16. මාත්‍රා 2+3 තාල රූපයට සමාන කර්ණාටක තාලය වන්නේ,
(1) ඛණ්ඩ චාපු තාලය යි. (2) ත්‍රිශ්‍ර චාපු තාලය යි.
(3) මිශ්‍ර චාපු තාලය යි. (4) රූපක තාලය යි.
(5) ආදී තාලය යි. (.....)

17. මුල් මාත්‍රයට අදාළ මූලික බෙරපදය අයත් වරණය තෝරන්න.
(1) කුං දින් තත් රෙගත ගදින ගත (2) දොංතකු දොං ජිංතක තරිකිට
(3) ගත්දින් තත් දොම්ත ගදින ගත (4) ජිංත ජිමින්තත් තක්කිට කිටිතක
(5) කුං දින් තත් දොං තක තරිකිට (.....)

18. කොහොඹා කංකාරියේදී වාදන ශිල්පියාගේ කුසලතාවයක් ඉස්මතු වන්නේ,
(1) ආවැන්දුම සහ මඟුල් බෙර වාදනයේදී ය.
(2) ඇන් ඇනුම සහ මඟුල් බෙර වාදනයේදී ය.
(3) යක් ඇනුම සහ අත්‍යා බෙර වාදනයේදී ය.
(4) යක් තුන් පදය සහ අත්‍යා බෙර වාදනයේදී ය.
(5) යක් තුන් පදය සහ පිං බෙර වාදනයේදී ය. (.....)

19. 1890 වර්ෂයේ දී ප්‍රථම වරට වේදිකාගත වූ මුද්‍ර නාට්‍ය වන්නේ,
(1) නිදි කුමරිය මුද්‍රා නාට්‍යය (2) හංස විල මුද්‍රා නාට්‍යට
(3) ද නට් ක්‍රැකර් මුද්‍රා නාට්‍යය (4) පටාචාරා මුද්‍රා නාට්‍යය
(5) සිරිසඟබෝ මුද්‍රා නාට්‍යය (.....)

20. අනුරාධපුර කුට්ටම් පොකුණ අසලින් ලැබුණු ලෝකඩ රූපයෙන් පිළිබිඹු වන්නේ,
(1) නිළියන් සහ නළුවන්ගේ රූප පෙළකි.
(2) බෙර වාදකයෙකුගේ රූපයකි.
(3) භ්‍රමණය වන නළඟනකගේ නර්තන විලාසයකි.
(4) වීණා වාදකයින් සහ තාලම්පට වයන ස්වරූපයකි.
(5) නටන ස්ත්‍රීහු සහ පුරුෂයෙකුගේ විලාසයකි. (.....)

21. පහන් පැළක් සකස්කර ගැනීම සඳහා මූලික වශයෙන් යොදා ගන්නේ,
(1) ගොප් අත්ත, ඉනි සහ කැඩපත යි. (2) ගොප් අත්ත, ඉනි සහ පහන යි.
(3) හබරල කොළ, ඉනි සහ පහන යි. (4) හබරල කොළ, ඉරටු සහ පනාව යි.
(5) කොළබෝ කොළ, ගොප් අත්ත සහ පනාව යි. (.....)

22. පහත දැක්වෙන චරිතය/ ඇඳුම් පැළඳුම්/ උපකරණ පිළිවෙළින් දැක්වෙන වරණය තෝරන්න.





(1) සොකරි, උල්උඩය, කඩිප්පු (2) ජසයා, තරු සහ කඩිප්පු
(3) නොංචි, ශිබා බන්ධනය, කඩිප්පු (4) ගුරුනාම්, උරබාහු, කඩිප්පු
(5) නොංචි, අවුල්හරය, කඩිප්පු (.....)

23. භවරිය, පනාව, කැඩපත, මාල, වලලු ආදී රංගෝපකරණ භාවිතයට ගන්නා නර්තනාංගය වන්නේ,
(1) කපුයක්කාරිය යි. (2) නානුමුරය යි.
(3) දරු නැලවිල්ල යි. (4) වඩිග පටුන යි.
(5) දොළහ පෙළපාලිය යි. (.....)

24. ශ්‍රී ලංකාවේ නර්තන කලාවේ ඓතිහාසික තොරතුරු විමසීමේදී වැදගත් වන්නේ,
(1) සාහිත්‍ය මූලාශ්‍ර සහ පුරාවිද්‍යා මූලාශ්‍ර ය.
(2) සාහිත්‍ය මූලාශ්‍ර සහ රූකම් ය.
(3) ලිඛිත මූලාශ්‍ර සහ සෙල්ලිපි ය.
(4) මහාවංශය සහ ගල් කැටයම් ය.
(5) සංදේශ කාව්‍ය සහ ගුහා චිත්‍ර ය. (.....)

25. වලියක් මංගල්‍යයේදී භාවිතා කරන වෙස් මුහුණ හඳුන්වනු ලබන්නේ,
(1) දළ කඩවර මුහුණු ලෙස ය. (2) ගරා කඩවර මුහුණු ලෙස ය.
(3) රීරී කඩවර මුහුණු ලෙස ය. (4) කළු කඩවර මුහුණු ලෙස ය.
(5) සුදු කඩවර මුහුණු ලෙස ය. (.....)

- **අංක 26 සිට 35 තෙක් ප්‍රශ්නවලට අදාළ පිළිතුර යොදා හිස්තැන් පුරවන්න**

26. බටහිර බැලේ නර්තනය ඉතාලියේ ප්‍රභවය වූයේ ..... වන ශත වර්ෂයේදී ය.

27. දීපංකර බුදුන් සමයේ බොරු කීමේ වරදට එහි විපාක විඳි බවට සන්නියකුමේ ..... කතාවෙන් පෙන්වා දෙයි.

28. බැලේ සංගීතයේ ප්‍රධාන වාද්‍ය භාණ්ඩය ..... ලෙස හඳුන්වයි.

29. භරත නාට්‍යම් සන්දර්ශනයක ඉතාම දීර්ඝතමවූත්, අසිරු වූත් නර්තන අංගය ..... වේ.

30. කැළණිය විශ්ව විද්‍යාලයීය සෞන්දර්ය අධ්‍යයන ආයතනය ..... වර්ෂයේදී සෞන්දර්ය කලා විශ්ව විද්‍යාලය බවට පත්විය.

31. 1918 වර්ෂයේදී ..... විසින් සම්ප්‍රදායික උඩරට වෙස් නැටුම මහනුවර දළදා පෙරහැරට එක් කළේය.

32. 'ලෙලවන දිගුනෙත නිලුපුල සේයා' කවිය ..... සන්දේශයට අයත් කවියකි.

33. ගජගා වන්නමට ප්‍රස්තුතය වී ඇත්තේ සක් දෙවිදුගේ වාහනය වූ ..... නම් හස්තියා ය.

34. ආධුනිකයෙකු තම්මැටිටම වාදනය පුහුණු වීම සඳහා යොදා ගන් ලබන්නේ ..... ය.

35. කහ රොටී පිදීම හා මී කැඩීම යන අංග අයත් වන්නේ, ... ශාන්ති කර්මයට ය.

- **ප්‍රශ්න අංක 36 සිට 50 තෙක් ප්‍රශ්නවලට අදාළ පිළිතුරු තිත් ඉරි මත ලියන්න.**

36. බටහිර බැලේ නර්තන ශිල්පිනියන් භාවිත කරන රැළි සහිත කෙටි ගවුම හා දිග ගවුම හඳුන්වන නාමයක් සඳහන් කරන්න.

I. දිග ගවුම - .....

II. කෙටි ගවුම - .....

37. අංග රචනය හා බැඳි මූලිකාංග දෙකක් වන්නේ,

I. .....

II. .....

38. වෙස් මෝස්තර රචනය ප්‍රධාන වශයෙන් කොටස් දෙකකි. නම් කරන්න.

I. .....

II. .....

39. හංසවිල මුද්‍රා නාට්‍යය ප්‍රධාන චරිත දෙක වන කුමරා සහ කුමරිය හඳුන්වන නම් සඳහන් කරන්න.

I. කුමරා - .....

II. කුමරිය- .....

40. අවකාශ භාවිතය ප්‍රධාන වශයෙන් කොටස් දෙකකට බෙදා දැක්විය හැකිය. නම් කරන්න.

I. ..... අවකාශය

II. ..... අවකාශය

41. බලි ශාන්තිකර්මයේදී බලි ඇඳුරා භාවිත කරන ප්‍රධාන රංග භාණ්ඩ දෙක ලියන්න.

I. .....

II. .....

42. බුද සිරු කුමරු පිළිබඳ කතා පුවත සම්බන්ධ ශාන්ති කර්මය හා එය අයත් සම්ප්‍රදාය නම් කරන්න.

I. ශාන්තිකර්මය - .....

II. සම්ප්‍රදාය - .....

43. ගැටබෙරය සකස් කිරීමේදී බෙර කඳ සුභ මුහුර්තියෙන් කපන නැකත සහ බෙරයට නම් යොදන නැකත හඳුන්වන නම් මොනවාද?

I. බෙරකඳ කැපීමට - .....

II. බෙරයට හම් යෙදීමට - .....

44. 'පෙර සිට පැවත එන - සිරිතට පොදිය බැඳගෙන....' යන කවිය අයත් චරිතය සහ නාටකය නම් කරන්න.

I. චරිතය - .....

II. නාටකය - .....

- **ප්‍රශ්න අංක 45 සහ 46 ප්‍රශ්නවලට පහත දැක්වෙන රූප ඇසුරෙන් පිළිතුරු සපයන්න.**



A



B



C



D

45. ඉහත A සහ B රූපවලින් දැක්වෙන රංග වස්ත්‍රාභරණ නම් කරන්න.

I. A රූපය - ..... II. B රූපය - .....

46. ඉහත C සහ D රූපවලින් දැක්වෙන නර්තන සම්ප්‍රදායන් නම් කරන්න.

I. C රූපය - ..... II. D රූපය - .....

47. ලක්දිව බලි යාගය බෞද්ධ මුහුණු වරකින් ස්ථාපිත කරලීමට පුරෝගාමී වූ හිමිවරුන් දෙදෙනෙකු නම් කරන්න.

I. .....

II. .....

48. ආලෝකකරණයේදී භාවිත ප්‍රධාන වර්ණ ප්‍රභේද දෙක නම් කරන්න.

I. ..... II. .....

49. පහත සඳහන් සහ රූපවල දැක්වෙන මනා ලෙස සංගීතය සහ නර්තනය මුසුකොට නිෂ්පාදනය කර ඇති චිත්‍රපට දෙක නම් කරන්න.



A



B

I. A - ..... II. B - .....

50. 'ගත ගුම්' හා 'ගුම් දැහැමි ගුද ගුද දැහිමි' යන බෙර පද වලින් වේදිකාවට ප්‍රවිශ්ට වන ගැමි නාටක චරිත දෙක නම් කරන්න.

I. ගත ගුම් - .....

II. ගුම් දැහැමි ගුද ගුද දැහිමි - .....

Past Papers Wiki

සියලු ම හිමිකම් ඇවිරිණි] All Rights Reserved]

විභාග අංකය - .....

පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව, නැගෙනහිර පළාත
Provincial Department of Education, Eastern Province

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) පෙරහුරු ඇගයීම - 2026 (ජූනි-ජූලි)
General Certificate of Education (Adv.Level) Practice Assessment – 2026 (June-July)

නර්තනය - (දේශීය) I1
Dancing - (Indigenous) I1

52 S II

ශ්‍රේණිය - 13
Grade - 13

පැය තුනයි
Three hours

අමතර කියවීමේ කාලය; - මිනිත්තු 10;
Additional Reading Time - 10 minutes

අමතර කියවීමේ කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත්, පිළිතුරු ලිවීමේදී ප්‍රමුඛත්වය දෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදා ගන්න.

උපදෙස්

- ❖ මෙම ප්‍රශ්න පත්‍රය I, II හා III වශයෙන් කොටස් තුනකින් සමන්විත වේ.
- ❖ I කොටසේ 1 හා 2 ප්‍රශ්න අනිවාර්ය වේ.
- ❖ II හා III කොටස් වලින් අවම වශයෙන් එක් ප්‍රශ්නය බැගින් හෝ තෝරාගෙන, අනිවාර්ය ප්‍රශ්න දෙක ද ඇතුළු ව ප්‍රශ්න පහකට පිළිතුරු සැපයිය යුතු ය.
- ❖ සෑම ප්‍රශ්නයකම (i) කොටසට ලකුණු 06ක් ද (ii) කොටසට ලකුණු 06ක් ද (iii) කොටසට ලකුණු 08ක් ද වශයෙන් මුළු ලකුණු 20 ක් බැගින් හිමිවෙයි

I කොටස

1. (i) පහත සඳහන් බෙර පද අතුරෙන් ඔබ උගත් සම්ප්‍රදායට අයත් බෙරපදය තෝරාගෙන ප්‍රස්තාර කරන්න.
   (අ) තෙහිං තකු // තෙහිං ජිං ගත් තත් ජිං තරිකිට
   (ආ) දිත්තම් දිතකු දොම් දොම් තා
   (ඇ) ජිමිත් තත්කිට තකට ජිමිතකු
   (ii) පහත සඳහන් කවි පද මාත්‍රා තුනේ තනි තිතට ප්‍රස්තාර කරන්න.
   'පෙර බුදු මගුලට ගෙනා උඩැක්කිය
   ඒ බුදු මඟුලට ගැසූ උඩැක්කිය'
   (iii) ගජගා වන්නමේ අඩවිව හෝ ග්‍රහදණ්ඩ නාලයේ ඉරට්ටිය හෝ ආනන්ද වන්නමේ අඩවිව ප්‍රස්ථාර කරන්න.

2. **"දේශීය නර්තන ඉතිහාසය අධ්‍යයනය කිරීමේදී සමාජ හා ආගමික නර්තනයේ විවිධ පැතිකඩ ප්‍රදර්ශනය වේ."**
   (i) 'ගම්පොළ යුගයේ නර්තන කලාවෙහි භාරතීය ආභාෂය ප්‍රදර්ශනය වේ.' පුරාවිද්‍යාත්මක සාධක දෙකක් ඇසුරෙන් තොරතුරු දක්වන්න.
   (ii) අනුරාධපුර හා පොළොන්නරු යුගයන්හි නර්තනයෙහි කාන්තා දායකත්වය සාධක දෙකක් ඇසුරෙන් විමසන්න.
   (iii) 'කොළඹ යුගයේ පටන් වර්තමානය දක්වා නර්තන අධ්‍යාපනය ප්‍රවර්ධනයෙහිලා පාසල් පද්ධතියට අමතරව තවත් විවිධ ආයතන පුරෝගාමී වී තිබේ.' සාධක හතරක් ඇසුරෙන් පැහැදිලි කරන්න.

II කොටස

3. "ශාන්තිකර්ම වලදී සම්ප්‍රදායික නර්තන වල ආවේණික ලක්ෂණ විවිධතා හා සමානතා මෙන්ම සමාජ සම්බන්ධතා මැනවින් විද්‍යාමාන වේ."

(i) පහතරට නර්තන සම්ප්‍රදායේ රට යකුම හෙවත් රිද්දියාගය ශාන්ති කර්මයේ එන නාට්‍යමය පෙළපාලිවල චරිත නිරූපණ අවස්ථා දෙකක් ඇසුරෙන් ඉහත පාඨය සනාථ කරන්න.

(ii) වලියක් මංගල්‍ය ශාන්ති කර්මය පැවැත්වීමෙහි ලා පුද්ගල හා සමාජ දායකත්වය හිමිවන ආකාරය විග්‍රහ කරන්න.

(iii) පුරාවෘත්ත මගින් හෙළිවන බෞද්ධාගමික පසුබිම හා සමාජ විශ්වාසය සන්නියකුම යාගය ඇසුරෙන් විමසුමට ලක් කරන්න.

4. "රංග වස්ත්‍රාභරණ, සැරසිලි හා අලංකරණවලට සෑම ශාන්තිකර්මයකදීම විශේෂත්වයක් හිමිවෙයි."

(i) ප්‍රකාශනය තීව්‍ර කිරීම සඳහා රංග වස්ත්‍රාභරණ යොදාගෙන ඇති ආකාරය සන්නියකුම ඇසුරෙන් විමසීමක් කරන්න.

(ii) 'බලි, යාග, ශාන්තිකර්මවල ඇඳුරාගේ භූමිකාව සතු ශිල්පීය ශක්‍යතා රාශියකි.' විචාරය කරන්න.

(iii) කිරිමඩුව ශාන්ති කර්මයේ රංග භූමිය හා රංග සැරසිලි විස්තර කර එහි කලාත්මක ලක්ෂණ අගයන්න.

5. "සමාජය විවරණය කිරීම ගැම් නැටුම් හා ගැම් නාටක මගින් සිදුවේ."

(i) ගැම් නැටුමෙන් විවරණය කෙරෙන ජීවන රටාව හා ආගමික පසුබිම පිළිබඳ විග්‍රහයක් කරන්න.

(ii) ගැම් නැටුම් හා ගැම් නාටක අතර ඇති වෙනස්කම් පෙන්වා දෙන්න.

(iii) කෝලම් චරිත දෙකක් තෝරා ගෙන ඒ ඇසුරින් සමාජ විවරණ පිළිබඳ විචාරයක් කරන්න.

III කොටස

6. පහත සඳහන් වගුවෙහි (අ), (ආ) සහ (ඉ) කොටස්වලට අදාළව අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

(අ) කොටස	(ආ) කොටස	(ඉ) කොටස
14 වන ලුවී රජු	නල දමයන්ති	ටූම්රි
2 වන හෙන්රි රජු	පටාචාරා	තිල්ලානා
මහා පීටර් රජු	නිදි කුමරිය	පුංග්වෝලම්
8 වන හෙන්රි රජු	බැරිසිල්	මද්දලකේළි

(i) (ආ) කොටසින් කැමති දේශීය මුද්‍රා නාට්‍යයක් තෝරාගෙන, එහි සංගීත නිර්මාණය, රංග වින්‍යාසය හා රංග වස්ත්‍රාභරණ එම කාර්යයට අද දායක වන ආකාරය විමසන්න.

(ii) (අ) කොටසින් බටහිර බැලේ නර්තන කලාව රුසියාවේ ව්‍යාප්ත කිරීමට පුරෝගාමී වූ රජ නම්කර, ඒ සඳහා ඔහුගේ දායකත්වය ලැබී ඇති අයුරු අගයන්න.

(iii) (ඉ) කොටසින් භාරත නාට්‍ය සම්ප්‍රදායට අයත් නර්තන අංගය තෝරා, එහි සුවිශේෂිතා ලක්ෂණ විස්තර කරන්න.

7. "සම්ප්‍රදායික රඟමඩලට වඩා නූතන වේදිකාව තුළ විවිධ සාධනීය ලක්ෂණ දක්නට ලැබේ."

(i) 'රංග භූමිය' නිර්වචනය කර, ශාන්ති කර්ම හා රංග භූමිය පිළිබඳව විස්තර කරන්න.

(ii) ප්‍රාසංගික වේදිකාවේ රංග සැරසිරි හා පසුතල නිර්මාණ භාවිතය පිළිබඳව විමසීමක් කරන්න.

(iii) ශාන්තිකර්ම ආශ්‍රිත ආලෝකකරණය සහ නූතන වේදිකා ආලෝකකරණය පිළිබඳව සංසන්දනාත්මකව විග්‍රහයක් කරන්න.

8. (i) රංග රචනය සහ චිත්‍ර සම්පිණ්ඩනය අතර සම්බන්ධතාවය විස්තර කරන්න.

(ii) රූපවාහිනිය මගින් ඉදිරිපත් කෙරෙන නර්තන වැඩසටහන් රසඥතා වර්ධනය කෙරෙහි බලපාන්නේ කෙසේදැයි විචාරය කරන්න.

(iii) සම්ප්‍රදායික ලක්ෂණ ආරක්ෂා වන පරිදි රංග ආභරණ ආකෘතියක් නිර්මාණය කර ගන්නා ආකාරය විමසන්න.

PAST PAPERS WIKI
WWW.PastPapers.WiKi
Downloaded From Past Papers WiKi - Sri Lanka's Largest Past Paper Bank